ආයතනයේ නම : පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

කම්ටුව විසින් හඳුනාගෙන ඇති දුර්වලතා	දුර්වලතාවය නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වර්තමාන තත්වය
<u>පළමු කොටස</u> 1. අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මෙම කාර්යාලයේ සීමිත කාර්යමණ්ඩලයක් සිටින බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් නිළධාරීන් නොමැත. වර්ෂයකට ඉතා අවම ගණුදෙණු ප්‍රමාණයක් සිදු වන අතර, අභ්‍යන්තර විගණනයන් සිදු නොකරන නමුත්, අවශ්‍ය අභ්‍යන්තර පාලන නියමිත පරිදි පවත්වාගෙන යමින් පාලන හා ගිණුම් කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
2. වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම පිළියෙල කර නොතිබුණි.	2021 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලස්මක් පිළියෙල කර තිබුණි.
3. 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂය සඳහා නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණය සිදු කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
4. සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	ආයතනය සතුව සංචිත වාහන නොමැති අතර, කොමසාරිස්තුමාගේ භාවිතයට පමණක් එක් වාහනයක් ඇත. දැනට එහි රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොමැත.
5. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව විශේෂිත වියදම් ඒකකය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2023 වර්ෂය සඳහා මෙම පරීක්ෂාවන් සිදු කරන ලදි.
6. බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබයි.
7. අනුමත අග්‍රිම ගිණුම් ශේෂ භාණ්ඩාගාරයේ පොත් සමඟ කාර්තුමය වශයෙන් සසඳනු ලබන අක්මුදල් සැසඳුම් ප්‍රකාශය නියමිත දිනට පෙර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ තුන්වන කාර්තුවේ සිට අක්මුදල් සැසඳුම් ප්‍රකාශය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
8. මු.රෙ.134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.	ඉහත 1 හි සඳහන් පරිදි වේ.

9. විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර දෙකක්වත් පවත්වා නොතිබුණි.	ඉහත 1 හි සඳහන් පරිදි වේ.
<u>දෙවන කොටස</u> 1. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන්නෙමු.
2. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව අනුව, ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, නත්වාගණනය කළ මතයක් ලෙස සඳහන් වේ. එහි සඳහන් පරිදි, එම වාර්තාවේ 1.6 ඡේදයේ කරුණු වලින් වන බලපෑම හැර, සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව දක්වා ඇත.
3. සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	ගිවිසුම්ගත වීමට තරම් දීර්ඝකාලීන පුහුණු පාඨමාලා සඳහා සහභාගීවීම අපේක්ෂා නොකරන බැවින් දැනට කාර්යයසාධන ගිවිසුම් සකස්කර නොමැති අතර ඉදිරියේදී අවශ්‍ය නම් ඒ සඳහා කටයුතු කිරීමට හැකිය.
4. ආයතනය තම විෂයය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ළඟාකර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	ආයතනයේ කාර්යයභාර්යයේ ස්වභාවය අනුව තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමු.
5. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2021 වර්ෂයේදී පැවති කෝවිඩ් වසංගතය හේතුවෙන් නිළධාරීන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීමට නොහැකි විය.
6. 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනයේ ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක හඳුනාගෙන ගැනීමට ඉදිරියේදී කටයුතු කරන්නෙමු.

කේ.බී.කේ. හිරිඹුරේගම

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්

(ඔම්බුඩ්ස්මන්)